# Frequently asked questions (FAQs)

1. **මේ සඳහා වැඩි විස්තර ලබාගත හැක්කේ කෙසේ ද?**

   කාර්යාල වේලාවන් තුළ දී (පෙ.ව. 8.00 - ප.ව. 4.30) මූලික විද්‍යා දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 081 2397221 ඇමතීමෙන් හෝ "අංශ ප්‍රධාන මූලික විද්‍යා දෙපාර්තමේනතුව, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය" යන ලිපිනයෙන් ද ලබා ගත හැක.

   **How can I get more information about body donation program in the Faculty of Dental Sciences?**

   Please contact the Department office directly at 081 2397221 during official hours (8.00am – 4.30pm) or send a request to the following address "Head, Department of Basic Sciences, Faculty of Dental Sciences, University of Peradeniya".

2. **මා හට මෙම පෝරම නිවසටම ගෙන්වා ගත හැකිද?**

   ඔව්, "අංශ ප්‍රධාන මූලික විද්‍යා දෙපාර්තමේන්තුව, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය" යන ලිපිනයට ඔබේ ඉල්ලීම කරන්න. හෝ දුරකථන අංක 081 2397221 වෙත දැනුම් දෙන්න.

   **Can I receive this form set to my home?**

   Yes you can, please make a request to "Head, Department of Basic Sciences, Faculty of Dental Sciences, Faculty of Dental Sciences, University of Peradeniya, Peradeniya" or contact 081 2397221.

3. **මෙම පොරමය පිරවීමෙන් පසු මා කළ යුත්තේ කුමක් ද?**

   මෙම පත්‍රිකා ගොනුවේ ඇති "මෘත ශරීර පරිත්‍යාග කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම" යන පත්‍රිකාව මරණින් පසු මෘත ශරීර දන්ත වෛද්‍ය පීඨයට භාර දීමට කැමැති අය විසින් පිරවිය යුතුය (එවැනි පත්‍රිකා දෙකක් ඇති අතර එම පත්‍රිකා දෙකම පිරවිය යුතු බව කරුණාවෙන් සළකන්න.) පුරවා අවසන් වූ පත්‍රිකා ඔබට මූලික විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යාලයට ගෙනවිත් භාර දිය හැකිය. එසේ නොමැතිනම් එය "අංශ ප්‍රධාන මූලික විද්‍යා දෙපාර්තමේනතුව, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය" යන ලිපිනයට තැපැල් කල හැකිය.

   **After filling this form, what should I do next?**

   Please make sure you accurately fill the form and then you can hand over personally to the Department of Basic Sciences office or otherwise send it via post, addressed to "Head, Department of Basic Sciences, Faculty of Dental Sciences, Faculty of Dental Sciences, University of Peradeniya, Peradeniya".

4. **මා හට ලියාපදිංචි අංකය ලබා ගන්නේ කෙසේ ද?**

   පුරවා සම්පූර්ණ කරන ලද පත්‍රිකා මූලික විද්‍යා දෙපරේතමේන්තුවට ලැබීමෙන් පසුව ඒවා අපගේ ලියාපදිංචි ලේඛණයේ ලියා පදිංචි කරනු ලැබේ. ඉන් පසුව එම ලියා පදිංචි අංකය සඳහන් කර, සපයා ඇති ලිපිනයට යවනු ලැබේ.

   **How can I obtain a registration number?**

After receiving the completed forms, the Department of Basic Sciences will enter your details into the “Body Donation Registration Book”, and then a registration number will be posted to the given address.

5. **ලියාපදිංචි නොවී මරණින්පසු මෘත දේහ දන්ත වෛද්‍ය පීඨයට භාරදිය හැකි ද?**

**හැකිය. ඒ සඳහා වැඩි විස්තර කාර්යාලයේ ද අංශයේ දුරකථන අංක 081 2397222 හෝ 081 2397221 යන අංක ඇමතීමෙන් ලබා ගත හැක.**

**Can my family members handover my body after death to the Faculty of Dental Sciences, without prior registration?**

Yes, please contact office at 081 2397222 or department office number 081 2397221 for more details.

6. **මෘත දේහයක් මූලික විද්‍යා දෙපාර්තමේන්තුවට භාර දෙන විට ලියකියවිලි අවශ්‍ය ද?**

**ඔව්. මරණ සහතිකයේ මුල් පිටපත හා භාර දෙන අයගේ හැඳුනුම් පත (පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේනතුවෙන් නිකුත්  කරන ලද) අත්‍යාවශ්‍යයය.**

**Are any documents needed when handing over the dead body?**

Yes, the Department of Basic Sciences needs the original copy of “Certificate of Death” and a photocopy of the National Identity card of the person who is officially handing over the body.

7. **මෘත දේහ භාරදෙන විට ගෙවීම් කළ යුතු ද?**

**නැත. මේ සඳහා කිසිදු මුදලක් අය නොකෙරේ.**

**Is there any payment when handing over a dead body?**

No, you don’t have to pay any payment.

8. **මෘත දේහයක් භාර දෙන විට කොන්දේසි ඇතොත් ඒවා කවරේ ද?**

- **වයස අවුරුදු 18 වැඩි මෘත දේහයක් විය යුතුයි**
- **මෘත දේහය එම්බාම් කල යුත්තේ කලවා පෙදෙසේ ඇති ඌරු ධමනිය කැපීමෙන් පමණි.**
- **මරණ පරීක්ෂණ හෝ ශල්‍ය කර්ම වලට භාජනය කළ මෘත දේහ භාර ගන්නේ නැත**

**Are there any conditions/rules regarding donating a dead body?**

- Age should be more than 18 years
- Embalming must be done only through the femoral artery (please see the body donation form  set)
- Bodies on which post-mortem or extensive surgery have been performed will not be accepted

9. **අක්ෂිදාන සංගමයට ඇස් දන්දීම කළ හැකි ද?**

ඇස් දන්දීම ගැන කිසිම විරුද්ධත්වයක් නොමැත

**Can I do the eye donation to Eye Donation Society?**

There is no objection to the eyes donated to the Eye Donation Society.

**10. ආගමික උත්සව පැවැත්විය හැකිද?**

නොහැකිය. අප ආයතනය තුල අවමංගල උත්සව කටයුතු පැවැත්විය නොහැක.

**Can we do the Religious ceremonies?**

No. There are no facilities for religious ceremonies available in the Department.